# මේ අන්තිම ඊළම් යුද්ධයද?

ශ්‍රී ලංකා නාවුක හමුදාපතිවරයා සමග කළ සම්මුඛ සාකච්ඡාවක් සැප්තැම්බර් 04 වෙනිදා ආණ්ඩුවේ 'ඩේලි නිවුස්' පත්‍රයෙහි පළවිය. ඒ, වත්මන් යුද තත්ත්වය සහ එහි ක්‍රියාන්විතයන්ගේ ප්‍රගතිය විමසනු පිණිස ය. ''ඔබේ දැක්මට අනුව මේ යුද්ධය දිනන්නට අපට පුළුවන්ද''යි 'ඩේලි නිවුස්' මාධ්‍යවේදියා සාකච්ඡාව අවසානයේදී නාවුක ප්‍රධානියාගෙන් විමසා තිබිණ. පිළිතුර මෙසේය: ''නියත වශයෙන්ම.....මේ අඩියරේදී අපිට මේ යුද්ධය දිනන්න බැරි වුණොත්, අපි කවදාවත් මේ යුද්ධය දිනන්නේ නැහැ''.

නාවුක හමුදාපතිවරයාගේ පිළිතුර කෙටි හා නිරාකුල එකකි. ඔහුට අනුව 'මේ වනවිට කොටි සංවිධානය සිටින්නේ පසු බසිමිනි. දැනට කොටි පාලනය යටතේ පවතින ප්‍රදේශයන්ද ඉතාමත් නුදුරේදී මුළුමණින්ම රජයේ හමුදා පාලනය යටතට ගනු ලැබීමට නියමිත අතර බොහෝ විට එය මාස කිහිපයක් පිළිබඳ ප්‍රශ්නයකි.' නමුත් මෙවර අපේක්ෂිත ජය අත්පත් කර නොගතහොත්, යළිත් කිසි දිනක මේ යුද්ධය ජයගත නොහැකි වනු ඇතැයි ඔහු කියන්නේ ඇයි? දිවයිනේ දකුණු පළාත්වල වෙසෙන බහුතරයක් ජනයා විසින් එතරම් වැදගත් කොට නොසැළකූ යථාර්ථයක් විද්‍යාමාන වන ඒ හැඟවුම විමසා බැලීමට තරම් වටිනා එකකි.

### පුළුල්ම ජාතික යුද-දේශපාලන සන්ධානය

යාපනයේ අවිගත් කණ්ඩායම් වසර අවසානය වන විට සහමුලින්ම අතුගා දැමීමේ ආඥාවක්ද සහිතව ජනාධිපති ජයවර්ධන විසින් බ්‍රිගේඩියර් තිස්ස වීරතුංග යාපනයට පිටත් කොට යැවූ 1979 ජූලි මාසය දළ වශයෙන් ඊළම් යුද්ධයෙහි ආරම්භක ලක්ෂ්‍යය සේ සළකතොත්, දැන් අප එළඹ සිටින්නේ ඊළම් යුද්ධයෙහි තිස්වෙනි අවුරුද්දට ය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වූ කලී ඒ යුද්ධයෙහි සේනාධිනායකයා බවට පත් වූ පස්වෙනි විධායක ජනාධිපතිවරයා වේ. නමුත් රාජපක්ෂ ආණ්ඩුව, මින් පෙර යුද්ධයට නායකත්වය දුන් ආණ්ඩුවලින් තීරණාත්මකව වෙනස්වන වැදගත් අංග ලක්ෂණ සහිත එකකි. ඉන් පළමුවැන්න ජාතික සන්දර්භයට අදාළව ය. දෙවැන්න, අන්තර්ජාතික සන්දර්භයට අදාළව ය.

ජාතික සන්දර්භයට අදාළව සළකතොත්, ඊළම් යුද ඉතිහාසය තුළ දකුණු ලංකාවේ පිහිටුවන ලද පුළුල්තම දේශපාලන සන්ධානය නියෝජනය වන්නේ රාජපක්ෂ පාලන තන්ත්‍රයෙනි. පළමුව, එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය අතර ඉතිහාසය තුළ ඇති කොටගත් පුළුල්ම සම්මුතිය නියෝජනය කරයි. මේ වනවිටත් එජාපයෙන් බිඳී ආ පාර්ලිමේන්තු නියෝජිතයන් 23 දෙනෙකු රාජපක්ෂ පාලනය හා එක්ව සිටියි. එය දෙවනුව, ඉන් ඔබ්බෙහි ඇති ජාතික හෙළ උරුමය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, මුස්ලිම් කොංග්‍රසය, කඳුරට ජනතා පෙරමුණ හා ලංකා කම්කරු කොංග්‍රසය පමණක් නොව, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු බලයෙන් තුනෙන් එකක් නියෝජනය කරන, ජාතික නිදහස් පෙරමුණේද සක්‍රීය ආධාරය භුක්ති විඳියි. තුන්වෙනිව, එය 'ට්‍රොට්ස්කිවාදී' වාසුදේව නානායක්කාරගේ සිට 'ස්ටැලින්වාදී' දයාන් ජයතිලක දක්වාද, 'ලිබරල්වාදී' රජීව විජේසිංහගේ සිට 'ජාතිකවාදී' අමරසේකර හා නලින්ද සිල්වා දක්වාද, 'ප්‍රජාතන්ත්‍රවාදී' ආනන්දසංගරීගේ සිට 'බෙදුම්වාදී' කරුණා අම්මාන් දක්වාද වන සියල්ලන්ගේ උද්‍යෝගී අනුමැතිය නියෝජනය කරයි. බැලූ බැල්මට විපාක්ෂික දේශපාලනයක නිරත එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ පවා රාජපක්ෂ පාලනයේ වත්මන් යුදමය ක්‍රියාමාර්ගය තාක්ෂණික විවේචන සහිතව වුවද, මූලධාර්මිකව අනුමත කරති. මීට අමතරව මුද්‍රිත සහ විද්‍යුත් ජනමාධ්‍ය අති මහත් බහුතරයක්ද, සංවිධානාත්මක ශිෂ්‍ය හා භික්ෂු බලවේගයන්ද, කලාකරුවන් සහ සිංහල නිල බුද්ධිමතුන්ද රජයේ යුදමය ක්‍රියාමාර්ගයට නොමඳ සහාය පළ කරති.

ඒ අනුව බලතොත්, ඉතිහාසය තුළ යුදමය ක්‍රියාමාර්ගයක් සඳහා වන සිංහල සහ දෙමළ සමාජයේ පුළුල්ම දේශපාලන අනුමැතිය නියෝජනය කරනු ලබන්නේ රාජපක්ෂ රජය විසිනි. යුද්ධය සඳහා දකුණේදී නිර්මාණය කොටගත හැකි මීට වඩා පුළුල් වූ ජාතික දේශපාලන සන්ධානයක් පිළිබඳ පරිකල්පනය කිරීමට පවා කිසිවෙකු සමත් නොවනු ඇත. 'මේ යුද්ධය මෙවර ජය නොගතහොත් කිසිදිනක ජයගත නොහැකි වනු ඇතැ'යි යන නාවුක හමුදාපතිවරයාගේ අනාවැකිය සනාථ කරන ජාතික දේශපාලන යථාර්ථය එයයි.

### මාවිල් ආරු මෙහෙයුම සහ ඇමරිකානු නිර්දේශ

සිව්වෙනි ඊළම් යුද්ධයට අදාළ ජාත්‍යන්තර සන්දර්භයද නෛසර්ගික ලක්ෂණ සහ ඓතිහාසික සුවිශේෂතා බහුල එකකි.

සාමාන්‍යයෙන් දිවයිනේ දකුණු පළාත්වල බහුතරයක් ජනයා තරයේ අදහනුයේ 'ජාත්‍යන්තර ප්‍රජාව' සහ වත්මන් යුදමය ක්‍රියාමාර්ගය අතර බලවත් ආතතියක් පවතින බවය. මේ ඇදහිල්ලට අනුව සීමිත මිතුරු රාජ්‍යයන් කිහිපයක් හැරෙන්නට අවශේෂ ජාත්‍යන්තර දේශපාලන බලවේග සියල්ලම පාහේ වත්මන් යුදමය ක්‍රියාමාර්ගයට කුමන්ත්‍රණකාරීව හරස් කපති. නමුත් මේ කිසිදු විශ්වාසයක් නිශ්චිත සාක්ෂි මගින් ප්‍රත්‍යක්ෂ කොටගත් ඒවා නොවේ. ඒවා පදනම් වන්නේ උද්වේගී ජනමාධ්‍ය සංවාද හා සනාථ කළ නොහෙන නොගැඹුරු ප්‍රවෘත්ති වාර්තා මතය. ඇත්තෙන්ම නම්, විෂය මූලික යථාර්ථය සපුරා මීට පටහැනි එකකි. එකින් එක විමසා බැලීම වැදගත් වන්නේ එහෙයිනි.

සිව්වෙනි ඊළම් යුද්ධය නිල වශයෙන් ආරම්භ වූයේ 2006 ජූලි මාසයේදී ය. පළමු ක්‍රියාන්විතයන්ගේ ඉක්මන් අවශ්‍යතාව වූයේ ත්‍රිකුණාමල වරායට දකුණු දෙසින් වූ ෆවුල් තුඩුවේ සිට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දකුණු සීමා මායිම වන වෙරුගල් ආරු දක්වා වන කලාපයේ කොටි ගරිල්ලා ක්‍රියාකාරීත්වය බිඳ දැමීමයි. පිළිගත් කතා පුවත අනුව ඊට පිටුබල සපයන ලද්දේ මාවිල් ආරු සොරොව්ව මුල්කොටගෙන හිටි හැටියේ තීව්‍ර වූ මතභේදයයි. නමුත් ඇත්ත වශයෙන්ම නම් නැගෙනහිර පළාතේ මෙකී භූ ගෝලීය කලාපය රජයේ හමුදා පාලනය යටතට නොපමාව ගැනීමේ වැදගත්කම ඉන් සිව් අවුරුද්දකට කලින් නිර්දේශ කරන ලද්දේ එක්සත් ජනපද පැසිෆික් ආඥා මූලස්ථානයට අනුයුක්ත මිලිටරි විශේෂඥයින්ගේ කණ්ඩායමක් විසිනි. ඇතැම්විට නාගරික ඉංග්‍රීසි පුවත්පත් පාඨකයින් අතළොස්සකට පමණක් මතක තිබිය හැකි 'සන්ඩේ ටයිම්ස්' පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු විසින් ඒ සම්බන්ධයෙන් කළ අනාවරණය, බහුතරයක් දකුණේ වැසියෝ නොදනිති.

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් හත් මාසයක් ඇතුළත 2002 සැප්තැම්බරයේදී ලංකාවට පැමිණි හවායිහී එක්සත් ජනපද පැසිෆික් ආඥා මූලස්ථානයට අනුයුක්ත ආරක්ෂක විශේෂඥයින් පිරිසක් සැප්තැම්බර් 30 වෙනිදා සිට ඔක්තෝබර් 10 වෙනිදා දක්වා කාලය තුළ දිවයිනේ ආරක්ෂක සැළසුම් පිළිබඳ විශේෂ අධ්‍යයනයක යෙදිණ. කර්නල් ජෝන් ඒ. කාර්ඩොස්ගේ නායකත්වයෙන් යුතු ඇමරිකානු හමුදා නිළධාරීන් 26 දෙනෙකුගෙන් සමන්විත මෙම විශේෂ දූත කණ්ඩායම ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවන්ගේ උපායික සහ උපක්‍රමික සංග්‍රාම ශක්‍යතා පිළිබඳ සමීප හැදෑරීමක නියැළිණ. ඔවුන් විසින් නිම කළ අවසන් වාර්තාව

ඔක්තෝබරයේදී ආරක්ෂක ප්‍රධානීන් වෙත භාරදෙනු ලැබිණ. 'ත්‍රීකුණාමලයේ ආරක්ෂාව පිළිබඳ' එහි යෝජිත වැදගත්ම නිර්දේශය සැකෙවින් මෙබඳුය:

*''ශ්‍රී ලංකා නාවුක හමුදාවට වඩාත් වැදගත් කඳවුර වන්නේ අවිවාදයෙන්ම ත්‍රීකුණාමල වරායයි. වර්තමානයේදී කොටි සංවිධානය වරායේ දකුණු භූමි භාගය පාලනය කරයි. මෙම ප්‍රදේශයේ සිට වරායට යන එන නෞකා ගමනාගමනය සාර්ථක ලෙස නිරීක්ෂණයටත්, නාවුක කඳවුරට එරෙහිව දිවි නසාගැනීමේ ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමටත් කොටි සංවිධානයට හැකියාව තිබේ....ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මෙකී භූමි භාගය වහා සුරක්ෂා කරගත යුතුය...මෙම ප්‍රදේශය පාලනය කිරීමට අසමත් වන්නේ නම්, ත්‍රීකුණාමලයේ වරාය සඳහා වන සටන හැමවිටම පරාජිත එකක් වනු ඇත. ත්‍රීකුණාමල වරාය නොමැති වීම යුද්ධය ක්‍රියාවට නැංවීමේ හැකියාවට බලවත් ලෙස අවාසි සහගත වනු ඇත.''*

එවකට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරණතුංග විසින් 2003 සැප්තැම්බර් 12 වෙනිදා දාතමින් යුතුව අගමැති රනිල් වික්‍රමසිංහ වෙත යොමුකරන ලිපියක් මගින්ද ඉහත වාර්තාවේ නිර්දේශයන්ගේ වැදගත්කම අවධාරණය කොට තිබිණ. ඇත්ත වශයෙන්ම 2006 ජූලියේදී සිව්වෙනි ඊළම් යුද්ධය අරඹමින් මාවිල්ආරු මෙහෙයුම විසින් ක්‍රියාවට නංවන ලද්දේ සිව් අවුරුද්දක් පැරණි ඇමරිකානු පැසිෆික් ආඥාවට අනුයුක්ත විශේෂඥයින්ගේ මෙකී නිර්දේශයන් ය.

**පසමිතුරන්ගේ කලාපීය සන්ධානයක්**

කෙසේ නමුත් සිව්වෙනි ඊළම් යුද්ධය, මින් පෙර නොවූ විරූ කලාපීය හා ගෝලීය සන්ධානයකට පසුබිම සකස් කොට තිබේ. එකිනෙකට පරස්පර භූ දේශපාලනික අභිලාෂයන් සහිත කලාපීය හා ගෝලීය බලවතුන් අතර විශ්මය ජනක සාපේක්ෂ සම්මුතියක් නිර්මාණය කරන්නට සමත් වූ ව්‍යතිරේකී රාජ්‍යයක් *(exceptional state)* බවට ලංකාව පත්ව ඇත්තේ ඒ අනුවය. ඉන්දීය සාගර කලාපය සහ වඩා පුළුල් ආසියානු භූ දේශපාලනික සන්දර්භය තුළ මුල් බැසගත් පසමිතුරුතා සහිත ඉන්දියාව, පකිස්ථානය, චීනය, ඊශ්‍රායෙලය හා ඉරානය වැනි රාජ්‍යයන් සියල්ලම පාහේ සිව්වෙනි ඊළම් යුද්ධයේදී ශ්‍රී ලංකා රජයේ මිලිටරිමය ශක්‍යතා වර්ධනය සඳහා දායක වී ඇත්තේ ඒ යටතේය. මේ වනාහී සැකෙවින් නමුත් විමසා බැලීම වැදගත් වර්ධනයකි.

ඓතිහාසිකව සලකතොත් ඉන්දියාව සහ ඊළම් යුද්ධය අතර සම්බන්ධතාව අතිශය සංකීර්ණතා ගහණ එකකි. එය පළමුව නිරවි යුද සමයේ කලාපීය භූ දේශපාලන පෙළගැසීම් පිළිබඳ යථාර්ථයන් යටතේ කොටි සංවිධානය ඇතුළු දෙමළ ජාතික සන්නද්ධ කණ්ඩායම් සඳහා නොමසුරු ආධාරය සැපයීය. දෙවනුව එකී කණ්ඩායම් දමනය කිරීමේ හෝ යටත් කිරීමේ යුද්ධයකට මැදිවිය. ස්වකීය රාජ්‍ය නායකයාගේ ජීවිතයෙන්ම එකී ක්‍රියාවලියේ මිල ගෙවා දැමීමෙන් පසු එළඹි තෙවෙනි සමයේදී විවෘත හා සක්‍රීය දායකත්වයක් පළකිරීමෙන් වැළකී සිටි ඉන්දියාව සිව්වෙනි ඊළම් යුද්ධයේදී යළිත් ක්‍රියාකාරී භූමිකාවකට අවතීර්ණ වී සිටියි. 'කොටි ශක්තිමත් කිරීමේ' චෝදනාවෙන් ගසා දමනු ලැබුවද සිව්වෙනි ඊළම් යුද්ධයේදී ඉන්දියානු භූමිකාව රාජපක්ෂ රජයේ පැහැදිලි වාසියට හේතු වී ඇති එකකි. දකුණු ඉන්දීය දේශපාලන විරෝධතා හේතුවෙන් ශ්‍රී ලංකාවට ප්‍රහාරක අවි සැපයීම සම්බන්ධයෙන් කලක් පැකිළෙමින් සිටි ඉන්දියාව සිය අවිසේවා කර්මාන්ත මණ්ඩලය හරහා 2007 ඔක්තෝබරය වන විට ඇමරිකානු ඩොලර් 40,000ක් වටිනා මිලි මීටර් 40 L-70 ගුවන් යානා නාශක ස්වයංක්‍රීය අවි සඳහා ඇණවුම් භාරගෙන ඇති බව 2007 ඔක්තෝබර් 15 වෙනිදා 'ටෛම්ස් ඔෆ් ඉන්ඩියා' පත්‍රය වාර්තා කළේය. ඒ වනාහී කොටි සංවිධානයේ ගුවන් ශක්‍යතාවන් සීමා කිරීම අරමුණු කොටගත් 'ඉන්ද්‍රා රේඩාර් පද්ධති හතරක් *('Indra' Low-flying Detection Radars)* සැපයීමට අමතර වශයෙනි.

2008 ජූලි 01 වෙනිදා 'ටෛම්ස් ඔෆ් ඉන්ඩියා' අනාවරණයකට අනුව සිව්වෙනි ඊළම් යුද්ධයේදී ඉන්දීය සහාය හුදු අවි සැපයීම ඉක්මවා ගිය එකකි. 2008-2009 කාල සීමාව තුළදී 500කට වැඩි ශ්‍රී ලංකා රජයේ හමුදා සාමාජිකයින් සඳහා ඉන්දීය ආරක්ෂක විද්‍යා පීඨයන්හි පුහුණුව ලබා දීමට නියමිතව තිබේ. මිසෝරාමයේ කැරලි මර්දන හා වනගත යුද ක්‍රියා පිළිබඳ පාසලේද, මහාරාෂ්ට්‍රයේ දෙව්ලාලිහී කාලතුවක්කු ප්‍රහාරක අධ්‍යයන පාසලේ ද, උත්තරාකාන්ද් ප්‍රාන්තයේ ඩේරාදූන් ඉන්දීය මිලිටරි ඇකඩමියේද, පූනේ හී මිලිටරි ඉංජිනේරු විද්‍යාලයේද, අහමෙද්නගර්හී යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේද, ජබාල්පූර්හි සම්පත් කළමනාකරණ පාසලේද, ගුජරාටයේ ඉලෙක්ට්‍රෝනික හා මිලිටරි ඉංජිනේරු පාසැල හා මධ්‍ය ප්‍රදේශයේ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මිලිටරි විදුහලේද මෙකී පුහුණුවීම් සිදු කෙරේ. 'වාර්ෂිකව ශ්‍රී ලංකා හමුදා නිළධාරීන් 800 දෙනෙකුට ඉන්දියාව නොමිලේ පුහුණු පහසුකම් සපයන බව' ජූනි 30වෙනිදා කොළඹදී විදේශ මාධ්‍යකරුවන් අමතමින් යුද හමුදාපතිවරයා විසින්ම ප්‍රකාශ කළ බව ඉන්දීය 'ටෙහෙල්කා' සඟරාවේ 2008 ජූලි 19 වෙනිදා කලාපය වාර්තා කොට තිබිණ.

මීට අමතරව අඩු දියුණු රටවල් සඳහා සැපයෙන සහනදායී ණය පහසුකම් වෙනුවෙන් ඉන්දියාව සිය වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන ඩොලර් මිලියන 500ක ප්‍රතිපාදනයන්ගෙන් ඩොලර් මිලියන 200ක් ශ්‍රී ලංකාව වෙත ප්‍රදානය කිරීමට ඉන්දියාව තීරණය කර ඇති අතර ඉන් මිලියන 100ක් ඍජු ආරක්ෂක ණය වශයෙන් වර්ගීකරණය කොට තිබේ. වඩා වැදගත් කරුණ වන්නේ අඩු දියුණු රටවල් පිළිබඳ ඉන්දීය නිර්ණායකය අනුව ශ්‍රී ලංකාව එම වර්ගීකරණයට අයත්ව නොතිබියදීත් සමස්ත ප්‍රතිපාදනයන්ගෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් ලංකාවට ලබාදීමට ඉන්දියාව තීරණය කිරීමයි. *(Times Of India / 27.04.2008)*

නමුත් අනෙක් අතින් සිව්වෙනි ඊළම් යුද්ධයේදී රාජපක්ෂ රජය කෙරෙහි ඉන්දියාව දක්වන අනුග්‍රහශීලී ආකල්පය, ඉන්දියාවේ සාම්ප්‍රදායික පසමිතුරන් වන පකිස්ථානය සහ චීනයේ උද්‍යෝගීමත් දයකත්වය සීමා කිරීමට කිසිසේත් බලපා නැත. ඉන්දීය හිටපු ඔත්තු සේවා ප්‍රධානියෙකු වන බී.රාමන් විසින් හෙළිදරව් කර තිබූ ආකාරයට 2006 අගෝස්තු මාසය වන විටත් පාකිස්ථාන ගුවන් හමුදා සාමාජිකයන්ද ඇතුළත් 15 දෙනෙකුට ආසන්න හමුදා උපදේශක පිරිසක් කොළඹ නිත්‍ය වශයෙන්ම ස්ථානගත කොට තිබූ අතර පකිස්ථාන *ISI* ඔත්තු සේවයේ කොළඹ කේන්ද්‍රීය ක්‍රියාකාරීත්වයන් පුළුල් කොට තිබිණ. *(South Asian Analysis Group - Paper No.106 / 18.08.2006)* පකිස්ථානය විසින් වාර්ෂිකව සපයනු ලබන යුද ආධාර ඩොලර් මිලියන 31ක් දක්වා ඉහළ දැමීමට පකිස්ථාන බලධාරීන් තීරණය කරන ලද්දේ 2007 වසර අවසානයේදී ය. කොළඹ පළවන 'සන්ඩේ ලීඩර්' පුවත්පතෙහි 2008 අගෝස්තු 17 වෙනිදා පළ වූ වාර්තාවකට අනුව, මේ වනවිට අවසාන අධියරට ළඟා වී ඇතැයි බහුලව විශ්වාස කෙරෙන රජයේ හමුදා ක්‍රියාන්විතයන් සඳහා සෑම දින 10කටම වරක් නැව්ගත පාකිස්ථානු යුද ආධාර ශ්‍රී ලංකාව වෙත සැපයීමට පකිස්ථාන හමුදා ප්‍රධානී පර්වේස් කයානී ප්‍රමුඛ පකිස්ථාන බලධාරීන් දැනටමත් එකඟතාව පළකර තිබේ.

අනෙක් අතින් ඉන්දියාවේ ප්‍රමුඛතම පසමිතුරු තරඟකරුවා වන චීනයේ භූමිකාවද නිරීක්ෂණය කිරීම වැදගත්කමක් සහිතය. චීනය ශ්‍රී ලංකා රජයේ ප්‍රධානතම අවි හා යුද ආධාර සැපයුම්කාරක රාජ්‍යයකි. දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අවි සැපයුම්කරුවෙකු වශයෙන් ද්විපාර්ශ්වික සම්මුතියකට එළඹ සිටියේ චීනයේ නොරින්කෝ *(North Industries Corporation)* සමාගමයි.

නමුත් 'ජේන්ස් ඩිෆෙන්ස් වීක්ලි' සඟරාවෙහි පළවූ වාර්තාවක් ඇසුරින් ඉන්දීය ප්‍රවීණ ආරක්ෂක ලේඛක රාහුල් බේඩි පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකා රජය 2007 අප්‍රේල් මාසයේදී චීනයේ පොලි ටෙක්නොලොජීස් සමාගම සමගද ඩොලර් මිලියන 37.6ක් වටිනා යුද අවි මිලදී ගැනීමේ නව එකඟතාවයකට එළඹුණු බවයි. මීට අමතරව චීනයේ ජාතික ඉලෙක්ට්‍රොනික ආනයන අපනයන සමාගම සමගද ශ්‍රී ලංකා රජය විශේෂිත යුද තාක්ෂණික වෙළෙඳ ගණුදෙනු පවත්වයි. *(Sri Lanka turns to Pakistan, China for military needs - Rahul Bedi / IANS , 02.06.2007)*

යුදමය කටයුතු ආර්ථිකය මත ඇති කරන පීඩනය අවම කරගත හැක්කේ යුද්ධය අතරවාරයේ සංවර්ධන ණය ආධාර ගලා ඒමේ ප්‍රවණතාව ආරක්ෂා කරගත හැකි තරමටය. ශ්‍රී ලංකාවට ප්‍රධානතම සංවර්ධන ණය ආධාර සපයන රාජ්‍යයක් වශයෙන් චීනය සපයන දායකත්වය ශ්‍රී ලංකා රජයට මෙහිදී අතිශය වැදගත්කමක් සහිත එකකි. ඩොලර් මිලියන 360ක් වැයකොට දියත් කෙරී ඇති හම්බන්තොට වරාය ව්‍යාපෘතිය මෙන්ම නොරොච්චෝලෙ තාප බලාගාර ව්‍යාපෘතිය හැරුණු විට 2007 වර්ෂය සඳහා පමණක් චීනය විසින් සැපයීමට එකඟතාව පළකොට තිබූ සමස්ත ණය ආධාර ප්‍රතිපාදනවල වටිනාකම ඩොලර් බිලියනයක් ඉක්මවන බව ඉකුත් අප්‍රේල් 11 වෙනිදා 'දි අයිලන්ඩ් පත්‍රය වාර්තා කොට තිබිණ.

මෙමගින් තහවුරු කරනුයේ කුමක්ද? තීව්‍ර වෙමින් පවතින අන්තර්-රාජ්‍ය භූ දේශපාලනික ආතතීන් සැළකූ විට ඉන්දියාව - පකිස්ථානය සහ චීනය, සිය පරස්පර අභිලාෂයන් යටතේ ඒකාබද්ධ කරන බන්ධන ලක්ෂ්‍යයක් බවට ශ්‍රී ලංකාවේ විමුක්ති කොටි ගරිල්ලන්ට එරෙහි සිව්වෙනි ඊළම් යුද්ධය පත්වෙමින් ඇති බවය. ජාත්‍යන්තර අවි ගණුදෙනු පිළිබඳ නිරීක්ෂණයේ යෙදෙන ස්ටොක්හෝම් ජාත්‍යන්තර සාම පර්යේෂණ ආයතනයේ 2008 වාර්ෂික වාර්තාව අනුව 2005 සිට 2007 දෙවසර තුළ ශ්‍රී ලංකාව කෙරෙහි වන ඉන්දු-චීන මිලිටරි අපනයන ප්‍රවණතාවන්ගේ දළ වටිනාකම පමණක් ඩොලර් මිලියන 40 ඉක්මවයි. *(Stolkholm International Peace Research Institute - Trend Indicator Values of arms Imports to Sri Lanka, 2005-2007)*

'මේ මොහොතේ නොහැකි නම් අපි කිසිදිනක යුද්ධය නොදිනමු'යි නාවික හමුදාපතිවරායගේ ප්‍රකාශයට වලංගුතාව සපයන කලාපීය යථාර්ථය හකුළා පෙන්වන්නේ මේ සියලු කාරණා මගිනි.

**(මතු සම්බන්ධයි)**

**රවීස**
*raveesa@googlemail.com*

*රාවය / 2008 සැප්තැම්බර් 14*